## *ජී. දිලීප් අමුදන් එදිරිව අධ්‍යාපන, සංස්කෘතික කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය , උතුරු පළාත් සභාව*

RTIC Appeal/20/2017 (2017.07.10 දින පැවැත්වූ කොමිෂන් සභා රැස්වීමේ කොටසක් වශයෙන් අභියාචනය අසන ලදී.

**සභාපති** : මහින්ද ගම්මන්පිල මහතා

**කොමිෂන් සභා සාමාජිකයෝ:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-ජයවර්ධන
ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
විනිසුරු ඒ.ඩබ්.ඒ. සලාම්
ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**අභියාචක** : ජී. දිලීප් අමුදන්, 361 කස්තුරියාර් පාර, යාපනය.

**පොදු අධිකාරිය නියෝජනය කළේ** : අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ නම් කළ නිලධාරී නියෝජනය කරමින් බී. අබිරාමි මෙනෙවිය, තොරතුරු නිලධාරිනී, සහකාර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු සහ ක්‍රීඩා, උතුරු පළාත් සභාව.

අභියාචක විසින් සිය තොරතුරු ඉල්ලීමෙන් උතුරු පළාත් සභාවේ අධ්‍යාපන, සංස්කෘතික කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සිය ධුරයේ රාජකාරි භාරගත් දිනයේ (2013/10/13) පටන් 31/01/2017 දිනය දක්වා සිදුකළ විදේශ සංචාරවල විස්තර ඉල්ලා තිබිණි. ඔහුගේ තොරතුරු ඉල්ලීම 5(1)(ඔ) වගන්තිය අනුව පළාත් සභා සාමාජිකයන්ගේ වරප්‍රසාද යන්න උපුටා දක්වමින් ප්‍රතික්ෂේප කර තිබිණි. පසුව අමාත්‍යවරයා පොදු අධිකාරියට ලිපියකින් දැනුම් දුන්නේ ඉල්ලා තිබෙන තොරතුරු ලබාදෙන ලෙස ය. මේ අනුව 2017.05.12 දිනැති ලිපිය මගින් අභියාචක වෙත තොරතුරු ලබාදෙන ලදී.

## කොමිෂන් සභාවේ නියෝගය

කොමිෂන් සභාවේ අභියාචනය විභාග වෙමින් පවතින අවස්ථාව වන විට අභියාචක හට තොරතුරු සපයා ඇති බැවින් මෙම අභියාචනය පාර්ශවයන්ගේ කැමැත්ත මත අවසන් කරන ලදී.